ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**<u>කොළඹ</u>**

## <u>පුවත්පත් නිවේදනය</u>
## <u>ඉන්දීය නාවික හමුදුවේ බටහිර බලඇණිය ශ්‍රී ලංකාවට පැමිණේ</u>

"මිත්‍රත්වයේ පාලම්" ගොඩනැගීම සඳහා ඉන්දීය නාවික හමුදුවේ ප්‍රයත්නයන් ඉදිරියටත් ගෙන යමින්, ඉන්දීය නාවික හමුදුවේ බටහිර බලඇණියේ නෞකා හතරක් එම බලඇණියේ අණදෙන නිලධාරී රියර් අද්මිරාල් සමීර් සක්සේනා මහතාගේ නායකත්වය යටතේ 2022 මාර්තු 09-12 යන දින වල ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. දේශීය ඉන්දීය තාක්ෂණය සහිත නියමු මිසයිල යුධ නෞකාවක් වන "බ්‍රහ්මපුත්‍ර" සහ තවත් යුධ නෞකාවක් වන "තල්වාර්" හම්බන්තොට වරාය වෙත ඇතුළු වූ අතර වඩා ඉහළ දේශීය තාක්ෂණයෙන් යුත් යුධ නෞකාවක් වන INS චෙන්නායි සහ තවත් යුධ නෞකාවක් වන "ටෙග්" කොළඹ වරායට ඇතුළු විය. මෙම නෞකාවන් ශ්‍රී ලංකා නාවික හමුදුව විසින් සාම්ප්‍රදයානුකූලව පිළිගන්නා ලදී.

2. මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා 2022 මාර්තු 10 වන දින INS චෙන්නායි නෞකාවේදී පිළිගැනීමේ උත්සවයක් පැවැත්වූ අතර විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා ශ්‍රී ලංකා ජනාධිපති සහ ආරක්ෂක අමාත්‍ය ගෝඨාභය රාජපක්ෂ මහතා නියෝජනය කරමින් එම අවස්ථාවට එක් විය. කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය.

3. අමුත්තන් පිළිගනිමින්, මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා සාගරයන්හි වැදගත්කම පිළිබඳව ද පොදු සෞභාග්‍යය, ආරක්ෂාව සහ වර්තමාන සන්දර්භය තුළ සෞඛ්‍යය ළඟා කර ගැනීම සඳහා සාගරය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව එකට එක් කරන ආකාරය පිළිබඳව ද අදහස් දැක්වීය. ඉන්දීය රජය මෙම පොදු අභියෝගයන් ජයගැනීම සඳහා ශ්‍රී ලංකාව සමඟ උරෙනුර ගැටී කටයුතු කිරීමට කැපවී සිටින බව එතුමා අවධාරණය කළේය. කොළඹ ආරක්ෂක

පර්ෂදය මෙම ක්ෂේත්‍රය තුළ වැදගත් පියවරක් බව ද ඒ හරහා සහයෝගීතාවය තවදුරටත් ඉහළ නැංවිය යුතු බව ද එතුමා ප්‍රකාශ කළේය. මෙම අවස්ථාව ඇමතූ රියර් අද්මිරාල් සමීර් සක්සේනා මහතා දෙරට නාවික හමුදාවන් අතර ශක්තිමත් මිත්‍රත්වයක් පවතින බව සඳහන් කළේය. කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (Security and Growth for All in the Region - SAGAR) සහතික කිරීම සඳහා සහයෝගී ප්‍රයත්නයන්හි අවශ්‍යතාවය එතුමා පෙන්වා දුන්නේය.

4. විදේශ අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ "අසල්වැසියා ප්‍රථමයෙන්"යන ප්‍රතිපත්තිය අගය කළේය. ඉන්දීය මුදල් අමාත්‍යතුමිය ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට ප්‍රමුඛතාවය සහතික කර තිබීම ද එතුමාගේ ප්‍රශංසාවට ලක් විය. ජනතාව අතර වඩා ශක්තිමත් සබඳතා, වරාය සංවර්ධනය කිරීම, ඉන්ධන සහ ගෑස් සහයෝගීතාවය, සංචාරක කර්මාන්තය සහ ශ්‍රී ලංකාව තුළ ඉන්දීය ආයෝජන ඉහළ නැංවීම යනාදිය ක්‍රියාත්මක කළ යුතු බව එතුමා ප්‍රකාශ කළේය. ලෝකයේ අනාගතය ඉන්දු - පැසිෆික් සහ බිම්ස්ටෙක් කලාපය මත රඳා පවතින බව ද එබැවින් IORA සහ ඉන්දීය සාගර සමුළුව වැනි ආයතන හරහා ශ්‍රී ලංකාව කලාපයේ අඛණ්ඩ සාමය වෙනුවෙන් රීතීන් මත පදනම් වූ ක්‍රමයක් ස්ථාපනය කිරීමට ප්‍රයත්න දරන බව ද එතුමා සඳහන් කළේය. ඉන්දීය නාවික හමුදාවේ මෙවන් සංචාර ඉදිරියේදීත් පිළිගැනීමට සූදානම් බව ද අමාත්‍යතුමා ප්‍රකාශ කළේය.

5. මාර්තු 10 සහ 11 දෙදින අණදෙන නිලධාරීතුමා ශ්‍රී ලංකා විදේශ ලේකම්තුමා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුධ හමුදාපතිතුමා සහ නාවික හමුදාපතිතුමා හමු විය. තව ද මෙම නෞකාවන් ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් පුහුණු ක්‍රියාකාරකම් සහ වෙනත් සමාජීය වැඩසටහන් සඳහා සහභාගී විය.

6. බටහිර නාවික බලඇණියේ ශ්‍රී ලංකා සංචාරය දෙරට නාවික හමුදාවන් අතර මිත්‍රත්වයේ බැඳීම් ශක්තිමත් කිරීමට ද වරාය තුළ සහ මුහුදේ දී සිදු කරන ගුවන් මෙහෙයුම්, ප්‍රති පිරවුම් ප්‍රවේශයන් සහ ක්‍රමෝපායික හමුදා ක්‍රියාකාරකම් ඇතුළු විවිධ ක්‍රියාකාරකම්

හරහා ක්ෂේත්‍රයේ සහෝදරත්වය වර්ධනය කිරීමට ද උපකාරී වනු ඇත.

***

කොළඹ
2022 මාර්තු 12